# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# University of Sri Jayewardenepura

## බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
## External Degrees and Extension Courses Unit

# විශේෂ නිවේදනයයි

**18 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය**

**2024 සඳහා අයදුම්පත් කැඳවීම - අදියර I**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 18 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය 2025 ජනවාරි මස 11 වන සෙනසුරාදා දින කොළඹ 07, බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

එහිදී පිරිනැමීමට නියමිත බාහිර උපාධි පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

1. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
2. ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධිය
3. ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය
4. සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය
5. වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
6. විද්‍යාවේදී කළමණාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධිය
7. විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය
8. විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යනය (සාමාන්‍ය) බාහිර උපාධිය

මේ වන විට අවසාන වසර විභාග ප්‍රතිඵල නිකුත් කර ඇති වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය හා සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය යන උපාධි පාඨමාලාවන්හි සිසුන් සඳහා අදියර I යටතේ උපාධි ප්‍රදානෝත්සවයට අදාළ අයදුම්පත් කැඳවීම සිදුකරනු ලබන අතර, අවසාන ප්‍රතිඵල නිකුත් කරන පිළිවෙල අනුව සුදුසුකම් ලබන අනෙකුත් උපාධිලාභීන්ගේ අයදුම්පත් අදියර වශයෙන් කැඳවනු ලැබේ. ඒ අනුව 18 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය සඳහා අදියර I යටතේ අයදුම්පත් කැඳවන උපාධිලාභීන්ගේ නාම ලේඛනය පහතින් දක්වා ඇත.

http://external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය “V” රහිතව යෙදීමෙන් උපාධි ප්‍රදානෝත්සවයට අදාළ අයදුම්පත් අංක 1 සහ 2 බාගත (Download) කරගත හැකිය.

1. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අංක 01 සහ 02
2. උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත
3. ගෙවීම් රිසිට්පත් තුනෙහි මුල් පිටපත්
   - උපාධි ප්‍රදානෝත්සවයට - රු.8000/=
   - විස්තරාත්මක සහතිකය - රු. 2500/=
   - නැවත ගෙවනු ලබන උපාධි ලෝගුව හා හිස් වැසුම - රු. 6000/=

මෙම සියලු ම ලේඛන එක් ලිපිගොනුවක් ලෙස සකසා එහි වර්ණ Scan පිටපතක් (Scan පිටපතේ ප්‍රමාණය 5MB වලට වඩා අඩු විය යුතුයි) 2024 නොවැම්බර් 26 වන දිනට පෙර මෙහි දක්වා ඇති Google Form හරහා උඩුගත (Upload) කළ යුතු වේ. ඊට අමතරව 2024 නොවැම්බර් 26 වන දිනට පෙර සම්පූර්ණ කරන ලද අයදුම්පත් අංක 01 සහ 02, උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත මෙන්ම ගෙවීම් රිසිට්පත් තුනෙහි මුල් පිටපත් පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ද එවිය යුතු වේ.

ලිපිනය :- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය,
තැපැල් පෙට්ටිය අංක 10,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල,
නුගේගොඩ

ලියුම් කවරයේ වම්පස කෙළවර “18 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය, උපාධි පාඨමාලාවේ නම සහ විභාග අංකය” සඳහන් කිරීම අනිවාර්ය වේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2024.11.13